# ඇමරිකන් එක්සත් ජනපද තානාපති කාර්යාලය

කොළඹ

# ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය

දුරකථනය: +94 (1) 249-8100 ෆැක්ස්: +94 (1) 244-9070
විද්‍යුත් තැපැල: OharaRM@state.gov http://lk.usembassy.gov

නිවේදන අංක: 20180621

**එක්සත් ජනපද - ශ්‍රී ලංකා සබඳතා පිලිබඳව කොළඹ එ.ජ. තානාපති කාර්යාලයේ ප්‍රකාශය**

**ජුනි 21,2018:** එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලයෙන් 2018 ජුනි 19 දින සිට බල පැවැත්වෙන ආකාරයට ඉවත්වන බව ලේකම් පොම්පියෝ විසින් නිවේදනය කර තිබේ. සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා කල්පවතින සාමය හා ප්‍රතිසන්ධාන අපේක්ෂාවන් වැඩි දියුණු කිරීමට ජාත්‍යන්තර ප්‍රජාවට දී ඇති වගකීම් ඉටු කිරීමට ශ්‍රී ලංකා රජය සමග එක්සත් ජනපද රජය කටයුතු කරන බවට සහතිකවීමට තානාපති කෙෂප් ජ්‍යෙෂ්ඨ ශ්‍රී ලංකා නිලධාරීන් හමු වූයේය.

ශ්‍රී ලංකාව එක්සත් ජනපදය සමග මානව හිමිකම් කොමිසමට යෝජනා දෙකක් ඉදිරිපත් කර තිබේ. එනම් 2015 වර්ෂයේ 30/1 දරණ යෝජනාව හා 2017 වර්ෂයේ 34/1 දරණ යෝජනායි. මෙම යෝජනාවල පැහැදිලිව දක්වා ඇති හා තහවුරු කළ ප්‍රතිඥා හා වැදගත් පොරොන්දු ඉටු කිරීමට අවශ්‍ය සහාය එක්සත් ජනපදය දිගටම ශ්‍රී ලංකාවට ලබා දෙනු ඇත. මෙම ජාත්‍යන්තර වගකීම් ඉටු කිරීමෙහිලා ශ්‍රී ලංකාව දක්වන ප්‍රගතිය, අපේ ද්වි පාර්ශවික සබඳතාවල වර්ධනය පහසු කිරීමටත් ලොව වටා සිටින මිතුරන් හා හවුල්කරුවන් සමග කටයුතු කිරීමට ශ්‍රී ලංකාවේ හැකියාව වර්ධනය කිරීමටත් හේතු වනු ඇත.

මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව දක්වන ප්‍රගතිය අපි දිගටම අනුයන අතර අපේ මෑත සබඳතාවල පදනම වූ මිත්‍රත්වයේ ජීවගුණයෙන් දැන් සිට 2019 මාර්තු දක්වා සමීපව කටයුතු කිරීමට අපේක්ෂා කරමු. ජිනිවා යෝජනා සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ඉදිරි පියවර ගන්නා විට අපේ ද්වි පාර්ශවික හවුල් සබඳතාව පුළුල් කිරීමටත් ඒවාට සහාය වීමටත් එක්සත් ජනපදය දිගටම ක්‍රියා කරනු ඇත.